
නවෙලිකා පතිරණ

# ජමනලීගේ ලෝකය



# සමනලීගේ ලෝකය

නවෙලිකා පතිරණ

# සමනලීගේ ලෝකය

නවෙලිකා පතිරණ

කතෘගේ වෙනත් කෘති

කිටීට දැන් සනීපයි

එළිදක්වන දිනය-2023.11.15

ISBN-978-624-206-773-5

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකෝමත් එක ගමක ගැහැණු ළමයෙක් හිටියා.

ඇයගේ නම සමනළීය.

ඇය ඉතා හුරුබුහුටි පුංචි ගැහැනු ළමයෙකි.

ඇය ජීවත් වුණේ ඉතාමත්

අලංකාර පුංචි ගමක ය.



එකෝමත් එක දවසක පුංචි සමනලී

උදෙන්ම නැගිටලා ජනේලය ඇරලා

සතුටින් කුස්සිය වෙත දුව ගියා.

අම්මා රසට ඉඳිආප්ප හදනවා “හරිම රස

පාටයි” සමනලී කීවා.



ඔව් දුවේ අද මම ඔයාට ඉස්කෝලේ ගෙනියන්නත්

එක්කයි  ඉඳිආප්ප හැදුවේ

සමනලී පරිස්සමින් ළිඳ ළඟට ගිහින් දත් මැදලා

මුහුණ සෝදලා පිරිසිදු වෙලා ගෙදරට දිව්වා.

පාසල් ඇඳුම් ඇදලා සමනලී කුස්සියට

ගියා. අම්මා සමනලීට

රසම රස ඉදි ආප්ප

පිඟානක් බෙදලා දුන්නා.



ගොඩක් රසයි සමනලී කීවාය සමනළී පොත් බෑගයත්

අතට ගෙන අම්මට වැඳ පාසල් යන්න පිටත් වුණා.

ඔන්න ටික දුරක් යනකොට සමනලීට හමුවුණා පුංචි

ලේන් පැටියෙක්. එයා අම්මා සොයනවා වගේ

සමනලීට හරිම දුකයි. සමනලී වටපිට බැලුවා.

සමනලීගේ ගෙදර වහලෙ උඩ ඉන්නවා ලේන් අම්මා

සමනලී පුංචි ලේන් පැටියා අතට ගෙන ආපහු ගෙදර

දිව්වා. ගෙමිදුලේ කොටයක් උඩ ලේන් පැටියා තියා

සමනළී ගියා. සමනලී හරිම සතුටින් නියර දිගේ

පාසල වෙත ගියා.

කුරුල්ලෝ සමනල්ලු ලේන්නු වගේ බොහෝ සත්තු

සමනළී දුටුවා. පාසලට ගිහින් සමනළී පන්ති අතුගෑවා.

පාසලේ සීනුව නාද වුණා. හැම ළමයෙක්ම තම පන්ති

සඳහා දිව ගියා. ගුරුතුමිය පන්තියට පැමිණියා.

සෑම දෙනා නැගිට ආයුබෝවන් යැයි කීවා.

අද අපි තනි තනියම සින්දු කියමු කාටද පුළුවන්

ලස්සන සින්දුවක් කියන්න. ගුරුතුමිය ඇහුවා.

සමනළී අත ඉහලට එසෙව්වා.

සමනළී ගිහින් ලස්සනට සින්දුවක් කිව්වා.

ලස්සන මල් හිනැහෙනවා

වන බඹරෝ කැරකෙනවා

පාට පාට සමනළුන් ද

පියඹාලා රොන් බොනවා

ආකාසේ කුරුලු පැටව්

සතුටින් අද  පියඹනවා

මං වාගේ පුංචි ළමයි

මල් වාගේ හිනැහෙනවා

හරිම ලස්සනයි හැමෝම කිව්වා සීනුව වැදුනා.

සෑම දෙනාම ගියා මූණ සෝදන ලිද ගාවට

සමනලීගේ අම්මාගේ රස ඉඳිආප්ප යාළුවන් සමග

බෙදාගෙන කෑවා පාසලේ සිට ගෙදර යනකොට


සමනළී වහු පැටියා කිරි බොනවා දැක්කා.

සමනලී කුඹුරට බැස්සා. සමනලීට වහුපැටියා

ලගට යන්න ආසා හිතුනා. වහු පැටියා. සමනලී

ළගට ආවම සමනලී වහු පැටියා ව අතගෑවා.

වහු පැටියෝ මම යනවා සමනලී කිව්වා.



ගෙදර ගිහින් සමනළී හොඳින් පිරිසිදු වී කුස්සියට ගියා. අම්මා තේ හදනවද සමනලි ඇහුවා. ඔව් දුවේ මං බතුත් ඉවුවා. අද  මං ඔයා ආස කොහිල දඬු හැදුවා මගේ අම්මා තමා හොඳම අම්මා සමනළී කීවා.

සමනළී තේ බීලා සමනලී ගෙදර වැඩ කළා.

ඊට පස්සේ අම්මා සමනලීට බඩ පිරෙන්න

කොහිල දඬු හා වැටි මාලු සමඟ රතු බත් කැව්වා.

අම්මේ තාත්ත කෝ සමනළී ඇහුවා තාත්තා ගියා.

කුඹුරට මමත් කුඹුරට යන්නද අම්මේ?

සමනළී ඇහුවා හොඳයි පරිස්සමෙන් යන්න.

සමනලී කුඹුරට දිව්වා. තාත්තේ මං ආවා.

කොහොමද මගෙ පුංචි කෙල්ල තාත්තෙ, කොහෙද

වහුපැටියා? අර අඹ ගහ යට ඉන්නවා. තාත්තේ

මම එතනට යන්න ද?

හොඳයි දුවේ පරිස්සමින් යන්න.

ලේන් පැටවු සමනලීට හිනගුනා. සමනලී දියපහර ලගට ගිහින් පිරිසිදු වෙලා වඳුපැටියා ලගට ගියා. සමනලී වඳුපැටියා සමග කුඹුර ළග වාඩිවී සිටියා. සමනලී හිතුවා. මට හරිම ලස්සන ගමක් තියෙනවා කියලා. වඳු පැටියා ලේන් පැටියා චූටි කුරුල්ලෝ සමනලීගේ හොඳම යාලුවෝ අන්න සුපිපි සමනලී කිව්වා. සමනලීත් සුපිපිත් වඳු පැටියා සමග සෙල්ලම් කරා. සමනලී වඳුපැටියා ට සහ සුපිපි ට සුභ දවසක් කියලා ලිඳ ලගට ගොස් පිරිසිදු වී ගෙදර ගියා. ලාම්පු එළියෙන් සමනළී බත් කෑවා.

දත් මැදලා පිරිසිදු ඇඳුම් ඇදලා සමනළී පාඩම් කළා.

ඊට පස්සේ සමනළී නිදා ගත්තා. අද නිවාඩු දවසක්

සමනළී නැගිටලා දත් මැදලා පාඩම් කළා.

හෙට සමනලීට ශිෂ්‍යත්වය ඉතින් අම්මා හා තාත්තා

පන්සලට යන්න සූදානම් වුණා.

සමනලී පිරිසිදු සුදු ඇඳුමින් සැරසී පන්සලට

යන්න සූදානම් උනා තෙල් මල් පහන් සහ හඳුන්කූරු ද

රැගෙන සමනලී පන්සලට ගියා.

ලොකු හාමුදුරුවන්ගේ ආශිර්වාද ගෙන

සමනළී ගෙදර ආවා. සමනලීට හරිම සතුටුයි.

අම්මා කිව්වා සමනළීට කිසිම බයක් නැතුව

හොඳට ලියන්න කියලා. පනුවදා වෙනකම්

සමනලීට ඉවසිල්ලක් නෑ සමනලී හොඳින්

විභාගය ලිව්වා. ටික කාලයක් ගියා ප්‍රතිපල ආවා.

හරි පුදුමයි. සමනලී විශිෂ්ඨ ජයක් ලබා ශිෂ්‍යත්ව

විභාගයෙන් සමත් ව ඇතැයි අම්මා කිව්වා.

සමනලීට හරිම සතුටුයි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01



# සමනලීගේ ලෝකය

මහනුවර මහාමායා බාලිකා විදුහලේ 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන මගේ නම නවෙලිකා පංචනී පතිරණ. විද්‍යුත් පොතක් නිර්මාණය කිරීමට ලැබීම ගැන මම මහත් සතුටු වෙමි.ඒ සදහා මා දිරිමත් කල ගරු විදුහල්පතිතුමිය පන්ති භාර ගුරුතුමිය ඇතුලු සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමි.